# කරුණාවන්ත ලේලිය වූ රූත්

- 20th Story-



138Page

**පොතේ ගුරා** බොහෝ කාලයකට පෙර බෙත්ලෙහෙම් නම් නගරයේ සාගතයක් ඇති වුණා. මේ බෙත්ලෙහෙමේ විසූ එලිමෙලෙක් නම් මිනිසා තමාගේ භාර්යාවත්, පුතාලා දෙදෙනාත් සමග මෝවබ් දේශයට ගියා. (සාගතයෙන් බේරෙන පිණිස) නමුත් එහිදී ටික කාලයකට පසුව අසනීප-යක් හේතුවෙන් එලිමෙලෙක් මිය ගියා.

................................................................................



139Page

**පොතේ ගුරා** එලිමෙලෙක්ගේ මරණයෙන් පසුව ඔහුගේ පුතාලා දෙදෙනා මෝවබ් දේශයේ ස්ත්‍රීන් දෙදෙනෙකු විවාහ කර ගත්තා.
වසර 10 ක් ගෙවී යද්දී මේ පිරිමි පුතාලා දෙදෙනාත් මිය ගියා.
අවසානයේදී නයෝමි සහ ඇයගේ ලේලීන් දෙදෙනා වන රූත් සහ ඕර්පා මේ දේශයේ තනි වුණා.

................................................................................



140Page

**පොතේ ගුරා** ඉශ්රායෙල්, බෙත්ලෙහෙමේ දුක් සහිත දිගු සාගත කාලයක් අවසන් වුණා. මේ නිසා නැවතත් අපගේ මව් දේශයට පිටත්ව යමු යි කියා නයෝමි සිතන්නට වුණා.

**නයෝමි** මට නැවතත් මගේම මව් දේශයට යන්න ඕන.

................................................................................



141Page

**පොතේ ගුරා** නයෝමි පිටත් වීමට තීරණයක් ගෙන, යන්නට පෙර තම ලේලීන් දෙදෙනා වන රූත් සහ ඕර්පාට කතා කළා.

**නයෝමි** ඔබ දෙදෙනාම දැන් ඔබලාගේ මව්වරුන්ගේ නිවෙස්වලට පිටත් වෙලා යන්න. මොකද මම මගේ මව් දේශයට නැවතත් යනවා.

**පොතේ ගුරා** මෙහිදී ඔවුන් තිදෙනාම එකිනෙකා වැළඳගෙන හැඬුවා. ඕර්පා හඬමින්ම තමගේ මව්පියන්ගේ ගෙදරට යන්නට ගියා.
නමුත් කරුණාවන්ත ලේලිය වූ රූත් තම නැන්දම්මා අසලම රැඳී සිටිමින් මෙසේ කීවා.

**රූත්** ඔබ යන තැනටම මමත් යමි. ඔබේ දෙවියන්වහන්සේ මගේත් දෙවියන්-වහන්සේ වන සේක.
ඒ නිසා ඔබව හැර යන පිණිස මට පෙරැත්ත නොකරනන්.

................................................................................



142Page

**පොතේ ගුරා** රූත්ගේ මේ තීරණයෙන් පසුව නයෝමි සහ රූත් දෙදෙනාම එක්ව ඉශ්රායෙල්හි බෙත්ලෙහෙමට යාම පිණිස පිටත් වුණා.

**බෙත්ලෙහෙමේ ජනතාව** ඕහ්...නයෝමි... ඔයාමද මේ ? ඇත්තටම ඔයා දැන් ගොඩාක් වයසට ගිහින් !!

**පොතේ ගුරා** මිනිසුන් හැමදෙනාම රූත් ගැනත් කතාබහ කරන්නට වුණා.

**ජනතාව** ඇය නම් ඇත්තටම හොඳ කරුණාවන්ත ලේලි කෙනෙක්ම තමයි.

**පොතේ ගුරා** ඔවුන් බෙත්ලෙහෙමට පැමිණි කාලය බාර්ලි අස්වනු නෙලන කාලයයි. මේ කාලයේ සියලු දෙනාම කෙත්වලට ගොස් අස්වනු නෙලා ගනී. නමුත් නයෝමි සහ රූත්ට යාමට කෙතක් තිබුණේ නෑ. ඔවුන්ට උදව් කිරීමට කිසිවෙක් සිටියෙත් නෑ.

**රූත්** නැන්දම්මේ... මම කෙත්වලට ගිහින්, ඉතුරු වෙන කරල් ඇහිඳින්නට පුලුවන්ද කියා බලන්නම්.

**පොතේ ගුරා** රූත් නම් මේ යහපත් ලේලිය කෙත්වලට ගොස් යමක් සොයාගන්නට වෑයම් කළා.

---



143Page

**පොතේ ගුරා** රූත් කරල් ඇහිඳින පිණිස එක්තරා කෙතකට ගිය අවස්ථාවේ එම කෙතේ අයිතිකරුවා වන බෝවස් මේ රූත්ව දැක්කා.

**බෝවස්** හ්ම්ම්... මම මීට කලින් මේ තරම් තරුණ ලස්සන කාන්තාවක් දැකලා තිබුණේ නෑනේ. ඈය ඉතාමත් ලස්සනයි.

**පොතේ ගුරා** බෝවස් මේ කාන්තාව ගැන තමාගේ දාසයෙක්ගෙන් විමසුවා.

**බෝවස්** මේ.... අර තරුණ කාන්තාව කවුද ?

**දාසයා(සේවකයා)** ඔව් ! ඈය මෝවබ් ස්ත්‍රියක්. නයෝමි සමග මෝවබ් රටෙන් පිටත්ව ආව කෙනෙක්. ඈය ඉතාම හොඳ සුශීලවත් ලේලි කෙනෙක්.

---



144Page

**පොතේ ගුරා** බෝවස් තමන්ගේ සේවකයන්ට කතා කළා.

**බෝවස්** මේ යෞවනියට කරල් ගොඩාක් අහුලන්නට හැකි වන සේ ඒවා ඉතුරු කරන්න. මිටි අතරින් ඈයට ඇහිඳින්නට ඉඩ දෙන්න. අහුරුවලිනුත් සමහරක් ඇද දමා ඈට ඇහිඳ ගැනීමට ඉඩ හරින්න.

---



145Page

**පොතේ ගුරා** රූත් කරල් අහුලා ඒවා විකුණා ගෙන පසුව සවස නිවසට ආ විගස දවසේ සිදු වූ සියලුම දේ තමාගේ නැන්දම්මා සමඟ පැවසුවා.

**නයෝමි** මෙපමණ ප්‍රමාණයක් ගන්නට තරම්, ඔයා අද වැඩ කළේ කොහේද ?

**රූත්** නැන්දම්මේ, මම අද වැඩ කළේ බෝවස් නම් අයෙකුගේ කෙතේ.

**නයෝමි** ආහ්.... ඔහු නම් අපට ළඟම ඥාතියෙක්. මීට පස්සේ ඔයා බෝවස්ගේ කෙතේ පමණක්ම දිගටම වැඩ කරන්න.

**පොතේ ගුරා** රූත් සහ බෝවස් විවාහ වෙනවා නම් ! ඒක කොපමණ මහත් දෙයක්ද ? යි නයෝමි තමාගේම සිතින් සිතා ගත්තාය.

---



146Page

**පොතේ ගුරා** බෝවස් රූත්ට කැමතිව සිටි නිසා හැමදාම කෙතට ඇවිත් බලාගෙන සිටියා. ඔවුන් දෙදෙනාම තමුන්ට කැමතිවන බව පෙණුනා. පසුව නයෝමි ඔවුන්ට ආශිර්වාද කරමින් විවාහ දිවියකට සුභ පැතුවා. පසුව ඔවුන් දෙදෙනාම විවාහ වුණා. ඔවුන්ගේ විවාහ මංගල්‍යය දින කිහිපයක් තුළ උත්සවාකාරයෙන් සමරනු ලැබූ අතර ඊට බොහෝ දෙනෙක්ම සහභාගී වුණා. පැමිණි සියල්ලෝම මේ දෙදෙනාට උණුසුම් සුබ පැතුම් එක් කරනු ලැබුවා.



147Page

**පොතේ ගුරා**

දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරමින් බෝවස් හා රූත්ට පුත්‍රයෙකු දෙනු ලැබුවා. නයෝමිත් ඉතාම සතුටින් සිටියා.
මේ පුත්‍රයාගේ නම ඔබෙද්. ඔබෙද් යනු දාවිත් රජතුමාගේ සීයා.
ඉශ්රායෙල්හි උතුම්ම රජතුමාගේ සීයා වූයේ මේ ඔබෙද් ය.

..........................................................................................

**ජීවිතයට අදාල කිරීම**

රූත් තමුන්ගේ නැන්දම්මාට කීකරුව සිටියා.
ඒවගේම රූත් දෙවියන්වහන්සේටත් කීකරුව සිටියා.
ඒ කීකරුකම නිසා එයාගේ අනාගත ජීවිතේ ගොඩාක් ලස්සන වුණා.
අපිත් දෙවියන්වහන්සේට කීකරු වෙනවා නම්, දෙවියන්වහන්සේ අපිට ආශිර්වාද කරනවා.
ඒ වගේම දෙමව්පියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට කීකරු වෙන්න.
කීකරු දරුවන්ට කවුරුත් ආශීර්වාද කරනවා.
දෙවියන්වහන්සේගේ ආශීර්වාදයත් ඒ අයට ගොඩක් ලැබෙනවා.